# පරිසර අමාත්‍යාංශය
# சுற்றாடல் அமைச்சு
# Ministry of Environment

"සොබාදම් පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சொபாதம் பியச", இல. 416/சீ/1, ரொபர்ட் குணவர்தன மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Sobadam Piyasa", No. 416/C/1, Robert Gunawardana Mawatha, Battaramulla, Sri Lanka.
Gen. Tel. +94-11-2034100

ලේකම් / செயலாளர் / Secretary +94-11-2034121
ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2879944


මගේ අංකය / எனது இல / My No: 03/04/61/ සුරකිමු ගංගා
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2021.01.4

පරිසර චක්‍රලේඛ 02/ 2021

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු/ දිසාපතිවරුන්
සහ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

## "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන

දිවයිනේ මධ්‍යම කඳුකරයෙන් ආරම්භ වී දසතට විහිදී යන ගංගා පද්ධතිය ශ්‍රී ලංකාවට උරුම වී ඇති ඉතාමත් අනර්ඝ ස්වාභාවික සම්පතකි. මෙම ගංගා විහිදී ඇති ආකාරය මත රටෙහි පරිසර පද්ධති, ජෛව හා පාංශු විවිධත්වය, කෘෂිකර්මාන්තය, ජනාවාස මෙන්ම විවිධාකාර කර්මාන්ත ද ස්ථානගතවී ඇත. අතීතයේදී ඉතාමත් පිරිසිදුව පැවති මෙකී ජලධාරාවන් මෑතකාලීන අවිධිමත් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විවිධාකාර තර්ජනයන්ට ගොදුරු වී ඇත. ජනගහන වර්ධනයත් ඒ හා බැඳුනු නාගරීකරණය හා කාර්මීකරණයත් අප රටෙහි ගංගා පද්ධතිය දූෂණයට ලක්වීමට මූලිකව හේතුකාරක වී ඇත. පොලිතින්, ප්ලාස්ටික්, මළ අපද්‍රව්‍ය, ඇතුළු විවිධාකාර නාගරික අපද්‍රව්‍ය ජල මාර්ග පද්ධති වලට අවිධිමත් ලෙස බැහැර කිරීම, කාර්මික අපද්‍රව්‍ය නිසි පිරිපහදුවකින් තොරව පරිසරයට බැහැර කිරීම, කෘෂිකාර්මික කාර්යයන් හේතුවෙන් සිදුවන පාංශු ඛාදනය සහ කෘෂි රසායන ද්‍රව්‍ය ගංගා ජලයට මුසු වීම, වර්තමානයේ බරපතල පාරිසරික තර්ජන ලෙස දැක්විය හැකිය. මීට අමතරව වැලි කැනීම්, මැටි කැනීම් සහ වෙනත් ඛණිජ ද්‍රව්‍ය කැනීම් වැනි මානව ක්‍රියාකාරකම් ද ඉවුරු ඛාදනය සහ ජෛවවිවිධත්ව හායනය ආදියද ගංගා හා ජල මාර්ග පද්ධති වල දීර්ඝ කාලීන පැවැත්මට අහිතකර හේතුකාරක ලෙස හඳුනාගෙන ඇත.

2. ඉහත අයුරින් සිදුවන විවිධාකාර ජල දූෂණයන් හේතුවෙන් අප රටෙහි ගංගා පද්ධතියට හානි සිදුවීම සමස්ත ජනජීවිතයට ඉතා අහිතකර ලෙස බලපෑමක් ඇතිකරන අතර ඒ හේතුවෙන් පානීය ජලය, ගෘහාශ්‍රිත කටයුතු, කෘෂිකර්මාන්තය, ජල විදුලිය නිපදවීම, සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය ආදී ඉතා වැදගත් ක්ෂේත්‍ර ගණනාවක පැවැත්මට අහිතකර ලෙස බලපෑම් ඇති කරයි.

3. මෙම තත්ත්වය සැලකිල්ලට ගනිමින්, රට හදන **සෞභාග්‍යයේ දැක්ම** ජාතික ප්‍රතිපත්තියේ තිරසර පරිසර ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ ගංගා පද්ධතිය සුරක්ෂිත කිරීම උදෙසා "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන ක්‍රියාවට නැංවීමට පරිසර අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

4. මෙම වැඩසටහන ජාතික මට්ටමෙන් මෙහෙයවීම පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් හා පාර්ශවකාර අමාත්‍යාංශ හා ආයතන වල සහභාගීත්වයෙන් යුත් **අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුව** මඟින් සිදු කරනු ලැබේ. මෙම කමිටුව දෙමසකට වරක් රැස්වී ජාතික මට්ටමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත්වීම සිදුකරනු ලබයි. වැඩසටහන තිරසාර මෙන්ම දිගුකාලීන වැඩසටහනක් ලෙස ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරිය විසින් දරනු ලබයි.

5. ජාතික වැඩසටහන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ පාර්ශවකාර ආයතන අතර මනා සම්බන්ධීකරණයක් සහිතව විධිමත්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාකාරී කමිටු පිහිටුවිය යුතු වේ.



"මේ මහපොළව සහ ගහකොළ මිනිසාට මෙන්ම අහසේ පියාසරන සියොතුන්ට ද මිහිමත සරන සිවුපාවුන්ට ද සියලු සතුන්ට ද එකසේ අයිතිය"
"இப் பூமியும், மரஞ் செடி கொடிகளும் மனிதனுக்குப் போன்றே வானில் பறந்து திரியும் பறவைகளுக்கும், பூமியில் வாழும் உயிரினங்களுக்கும், அனைத்து விலங்குகளுக்கும் ஒருமித்துச் சொந்தமானது"
"This great earth and the flora on it equally belong to the man and the birds flying in the sky, the quadrupeds and all creatures living on earth"

6. දිස්ත්‍රික් කමිටු දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් දිස්ත්‍රික් මට්ටමෙන් මෙම වැඩසටහන මෙහෙයවීම සඳහා පිහිටවනු ලබන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතු බව යෝජනා කෙරේ.

1. දිස්ත්‍රික් ලේකම්/දිසාපති - කමිටු සභාපති
2. මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික්කය භාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ - කමිටු ලේකම්
3. පළාත් සභාවේ ප්‍රධාන ලේකම් නියෝජනය කරමින් නියෝජිතයෙකු .
4. රාජ්‍ය අංශ සාමාජිකයන් - පහත සඳහන් ආයතනවල දිස්ත්‍රික් නිලධාරීන්
   i. පළාත් පාලන දෙපාර්තමේන්තුව
   ii. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
   iii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
   iv. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
   v. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
   vi. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
   vii. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
   viii. ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව
   ix. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
   x. අධ්‍යාපන දෙපාර්තමේන්තුව
   xi. ශ්‍රී ලංකා පොලීසිය
   xii. සිවිල් ආරක්ෂක බලකාය
   xiii. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
5. රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන්
6. ප්‍රජා මූලික සංවිධාන නියෝජිතයන්
7. පරිසර අමාත්‍යවරයාගේ එකඟත්වයෙන් පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන නියෝජිතයෙකු

7. දිස්ත්‍රික් කමිටුව මගින් ප්‍රාදේශීය කමිටුවල ක්‍රියාකාරීත්වය නිරන්තර අධීක්ෂණයට ලක්කිරීමත් ජාතික කමිටුව සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ. දිස්ත්‍රික් කමිටුව සෑම මසකට වරක්ම රැස්වීමට යෝජිත අතර එහි සාකච්ඡා සටහන් වල පිටපත් අමාත්‍යාංශයට ද එවන මෙන් දන්වා සිටිනු ලැබේ.

8. ප්‍රාදේශීය කමිටු ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතිත්වයෙන් පිහිටවිය යුතු අතර කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

1 .ප්‍රාදේශීය ලේකම් - කමිටු සභාපති
2. ප්‍රාදේශීය පරිසර නිලධාරී - කමිටු ලේකම්
3. පළාත් පාලන ආයතනය / ආයතන නියෝජනය කරන නියෝජිතයන්
4. රාජ්‍ය අංශ සාමාජිකයන් - පහත සඳහන් ආයතනවල ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්
   i. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
   ii. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
   iii. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
   iv. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
   v. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
   vi. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
   vii. අධ්‍යාපන දෙපාර්තමේන්තුව
   viii. ශ්‍රී ලංකා පොලීසිය
   ix. සිවිල් ආරක්ෂක බලකාය
5. ග්‍රාම නිලධාරීන්
6. රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන්
7. ප්‍රජා මූලික සංවිධාන නියෝජිතයන්
8. පරිසර අමාත්‍යවරයාගේ එකඟත්වයෙන් පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන නියෝජිතයෙකු

සැ.යු.: ඉහත සඳහන් සාමාජිකයන්ට අමතරව දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු සඳහා හඳුනා ගන්නා වැදගත් පාර්ශවකාර ආයතන නිත්‍ය සාමාජිකයන් ලෙස පත්කර ගැනීමටත්, වෙනත් අවශ්‍ය යැයි හැඟෙන ප්‍රාදේශීය මට්ටමේ ආයතන නිලධාරීන් හෝ සාමාජිකයින් අවශ්‍ය අවස්ථාවල කැඳවීමටත් කමිටුවට බලය ඇත.

9. ප්‍රාදේශීය කමිටුව තම ප්‍රාදේශීය බල ප්‍රදේශයට අයත් ගංගාවේ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි නිරීක්ෂණය කර ගංගාවේ පැවැත්මට හා ජලයේ ගුණාත්මකභාවයට හානිවන ප්‍රභවයන් හඳුනාගැනීමටත්, සංරක්ෂණය සඳහා කළයුතු කාර්යයන් හඳුනාගැනීමටත් කටයුතු කළ යුතු අතර ඒ සඳහා තිරසාර විසඳුම් ද හඳුනාගත යුතුය. මේ සම්බන්ධයෙන් උපයෝගී කරගත හැකි මාර්ගෝපදේශ සංග්‍රහයක් පරිසර අමාත්‍යාංශය විසින් නිකුත් කිරීමට නියමිතය. මීට අමතරව දිවයිනේ සියලුම ගංගා පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය විසින් සමීක්ෂණයක් සිදුකර ඇති අතර ඒ අනුව සකස් කරන ලද පරිගණක යෙදවුමේ සහය ද මේ සඳහා භාවිතා කළ හැකිය.

10. ප්‍රාදේශීය කමිටුව සෑම මසකට වරක් රැස්කිරීමට කටයුතු කළයුතුය. කමිටු රැස්වීම් වාර්තා සහ එහිදී පැන නගින ගැටළු දිස්ත්‍රික් කමිටුව හරහා ජාතික කමිටුව වෙත ඉදිරිපත්කිරීමට ද කටයුතු කිරීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ වගකීමකි.

11. ප්‍රාදේශීය වශයෙන් ඇති රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය සහ එම ආයතන මගින් දායකත්වය ලබාගෙන ඉටුකළ හැකි මෙම වැඩසටහන සඳහා වැදගත්වන කාර්යයන් හඳුනාගැනීම සහ එම කාර්යයන් නිසි අනුමැතියක් සහිතව ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය කමිටුවේ වගකීමක් ලෙස ද හඳුනාගෙන ඇත.

12. තමන්ගේ බලප්‍රදේශයන් අනුව ගංගාවන් ආශ්‍රිත තිරසාර පරිසර ආර්ථික විභවයන් පිළිබඳ නිසි අධීක්ෂණය, ගඟ දෙපස රක්ෂිතයන් නිසිලෙස නඩත්තු කිරීම සහ එහි ජෛවවිවිධත්ව සංරක්ෂණ කාර්යයන් සඳහා සහය වීම, ප්‍රදේශයේ ජනතාව මෙම "සුරකිමු ගංගා" ජාතික වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම, මහජන අදහස් සහ යෝජනා පිළිබඳ සැලකිලිමත් වීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී ජනතා සහයෝගය ලබා ගැනීම ද දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කමිටුවල වගකීමක් සේ සලකනු ලැබේ.

13. මෙම වැදගත් ජාතික වැඩසටහනේ ප්‍රගතිය අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන්, ගරු අග්‍රාමාත්‍යතුමන්, ගරු පරිසර අමාත්‍යතුමන් සහ ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපති ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමන්ගේ සහභාගිත්වයෙන් නිරන්තර අධීක්ෂණයට ලක් කිරීමට ද නියමිත වේ.

14. මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ සහ රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලද්දකි.

වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්

| | | |
|---|---|---|
| පිටපත් | 01. ජනාධිපති ලේකම් | කා.දැ.ගැ.ස. |
| | 02. අග්‍රාමාත්‍ය ලේකම් | කා.දැ.ගැ.ස. |
| | 03. අමාත්‍ය මණ්ඩල ලේකම් | කා.දැ.ගැ.ස. |
| | 04. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ | කා.දැ.ගැ.ස./අ.ක.ස. |
| | 05. ලේකම්, රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය | කා.දැ.ගැ.ස./අ.ක.ස. |
| | 06. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් | කා.දැ.ගැ.ස./අ.ක.ස. |
| | 07. සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් | කා.දැ.ගැ.ස./අ.ක.ස. |
| | 08. සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් | කා.දැ.ගැ.ස./අ.ක.ස |
| | 09. සියලුම ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් | කා.දැ.ගැ.ස./අ.ක.ස |
| | 10. සභාපති -මධ්‍යම පරිසර අධිකාරිය | කා.දැ.ගැ.ස./අ.ක.ස |
| | 11. අධ්‍යක්ෂ ජනරාල්- මධ්‍යම පරිසර අධිකාරිය | කා.දැ.ගැ.ස./අ.ක.ස |